# බෞද්ධ ශිෂ්ටාචාරය - II පත්‍රය 2022
# පිළිතුරු පත්‍රය

## I කොටස

1.

I.

★ ප්‍රජානං රක්ෂණං දාන - මිජ්‍යාධ්‍යයන මේවච
විෂයේශ්ව ප්‍රශක්තිශ්ච - ක්ෂත්‍රියස්ශ්‍ය සමාසතඃ

★ ප්‍රජාපාලනය, දන්දීම, යාගකිරීම, ඉගෙනීම, කාමයෙහි නොඇලී කටයුතු කිරීම

✪ ශ්ලෝකය පමණක් දැක්වීමට ලකුණු 01යි.
✪ ස්වධර්ම හතරක් නම් කිරීමට ලකුණු 02යි.
✪ ස්වධර්ම 2/3 නම් කිරීමට ලකුණු 01 යි.

II.

★ ඊශ්වර නිර්මාණ වාදය පිළිගැනීම .
★ වේද ග්‍රන්ථ පරම සත්‍ය ලෙස පිළිගැනීම.
★ අනගාරික ප්‍රතිපදාව පිළිගැනීම.
★ කාන්තාවගේ සියලු වරප්‍රසාද අහිමිකිරීම.
★ ජන්මීය සාධක මත පුද්ගලයාගේ උසස් පහත් බව තීරණය වීම.
✪ එක් කරුණකට එක් ලකුණ බැගින් ලකුණු 03 යි.

III.

★ බුද්ධ කාලයේ ගණතන්ත්‍ර රාජ්‍ය ලෙස හඳුන්වා ඇත.
★ ව්‍යවස්ථාදායක, විධායක, අධිකරණ, යන බලතල කණ්ඩායමක් මගින් තීරණය කිරීම.
★ බුද්ධකාලයේ භාරතයේ වජ්ජි හා මල්ල වශයෙන් ප්‍රධාන ගණතන්ත්‍ර රාජ්‍යයන් දෙකක් පැවති බව.
★ ප්‍රාදේශීය පාලකයන් සමූහයකගේ තීරණය මත පාලනය කළ බව.
★ සප්ත අපරිහානිය ධර්ම අනුව පාලනය වූ අතර බුදුරජාණන් වහන්සේගේ ප්‍රසංශාවද ලැබුණු බව.

✪ කරුණු 2 ක් නම් කර ඇත්නම් ලකුණු 01 යි.
✪ කරුණු 3 ක් හෝ 4 ක් නම්කර ඇත්නම් ලකුණු 02 යි.
✪ කරුණු 3 ක් ඇසුරින් කරන ලද විවරණයට ලකුණු 04 යි.

IV.

★ වෙළඳාම දියුණු වීමත් සමග නගර බිහිවූ බව.
★ විවිධ වෙළඳ මාර්ගයන් නිසා නගරයන් බිහි වන්නට වූ බව.
★ මහා පරිමාණයේ වෙළෙන්දන් සිටි නිසා නගර ඉදි වූ බව.
★ නගර බිහිවීමත් සමග සුරාසැල්, භෝජනාගාර, වෙළඳශාලා, ගණිකා නිවාස, ආදිය නගරය තුළ තිබූ බව.
★ විවිධ වෙළඳ කූට උපක්‍රම මෙන්ම අධාර්මික වෙළඳ ක්‍රම අනුගමනය කළ බව.
✪ මෙම කරුණු නිසා නාගරීකරණයක ස්වභාවය දැකගත හැකි බව කෙටියෙන් හැඳින්වීම.
✪ කරුණු පහක් නම් කිරීමට ලකුණු 03 යි.
✪ කරුණු හතරක් නම් කිරීමට ලකුණු 02 යි.
✪ කරුණු තුනක් නම් කිරීමට ලකුණු 01 යි.

V.

★ මොහුගේ ඉගැන්වීම දීඝ නිකායේ සාමඤ්ඤඵල සූත්‍රයේ දැක්වෙයි.
★ මොහු කර්ම - විපාක බැහැර කරයි. මේ නිසා අකිරියවාදියෙකු ලෙස හඳුන්වයි.
★ ස්වභාව නීතියකට අනුව සත්වයාගේ සසර ගමන සිදුවනබව උගන්වයි. මේ නිසා නියතිවාදියෙකු ලෙස හඳුන්වයි.
★ සියලු සත්වයන්, සියලු ප්‍රාණීන් වීර්ය රහිත, බල රහිත, ස්ව කැමැත්ත අනුව කටයුතු කළ නොහැකි පිරිසක් ලෙස හඳුන්වයි. එනිසාම මොහුගේ ඉගැන්වීම් මඟින් සත්වයාගේ කෙළෙසීමට හෝ විශුද්ධියට හෝ හේතු ප්‍රත්‍යක් නැතැයි කියා ඉගැන්නූ නිසා අහේතු අප්‍රත්‍යවාදියෙකු ලෙස හැඳින්වෙයි.
★ මොහුගේ ඉගැන්වීම බුදුරජාණන් වහන්සේ ප්‍රතික්ෂේප කර ඇති බව.
★ සියලු සචේතනික ක්‍රියාවල ප්‍රතිඵල තමාට ලැබෙන බව.
★ ගඟක දමා ඇති කෙමන තුලින්, යම් ආකාරයකට මත්ස්‍යයන්ට අහිතකර පිණිස පවතී ද, ඒ හා සමානව මොහුගේ දර්ශනය පුද්ගලයාට අහිතකර පිණිස පවතින බව.
✪ මක්කලී ගෝසාලගේ ඉගැන්වීම් දැක්වීමට ලකුණු 03 ක් ද, සමාජ සදාචාරයට සිදුවන අහිතකර බලපෑම දැක්වීමට ලකුණු 03 ක්ද ලෙස.

2.

I.

★ දෙවියන් සහිත ලෝකයාට දෙලොව යහපත පිණිස අනුශාසනා කරන බැවින්.
★ දෙවි මිනිසුන්ට ශාස්තෘවරයා මෙන්ම ගුරුවරයකු වන බැවින්.

II.

★ සුනීතට පිහිට වීම
★ සෝපාකට පිහිට වීම
★ පූතිගත්ත තිස්ස හිමියන්ට පිහිට වීම
✪ අවස්ථා 03 ක් නම් කිරීමට ලකුණු 01 යි
✪ අවස්ථා 03 ක් නම් කර කරන ලද කෙටි හැඳින්වීමට ලකුණු 03 යි.

III.

- ★ සැරියුත් හිමියන් :- ''තුසිත දෙව්ලොව සිට සමූහයා අතරට පැමිණ මෙහෙම ලස්සනට කතා කරන ශාස්තෘවරයකු මීට කලින් මා කිසිම තැනකදී දැක නැත. එවන්නකු ගැන අසා හෝ නැත.''
- ★ සෝණදණ්ඩ බමුණා :- ''ශ්‍රමණ භවත් ගෞතමයන් හත්මුතු පරම්පරාවෙන්ම මව් පිය දෙපසින් ම පිරිසිදු ය. නොකැළල් කුලයක් ඇත. .....''
- ★ කොණ්ඩඤ්ඤ රහතන් වහන්සේ, පොට්ඨපාද පිරිවැජියා, නිග්‍රෝධ පිරිවැජියා, චංකි බමුණා.
- ★ ඇල්බට් අයින්ස්ටයින් :- ''නූතන විද්‍යාත්මක චින්තනය පිළිගත හැකි ආගමක් වේ නම් ඒ බුදු දහමයි.''
- ★ බර්ට්‍රන්ඩ් රසල් :- ''ලෝකයේ සුප්‍රසිද්ධ ආගම් වලින් මා බුදු දහමට විශේෂයෙන් මුල් බුදු දහමට කැමැති වන්නේ එය කිසිවකු නොපෙළෙන බැවිනි.''
- ★ මහාචාර්ය සෝණ්ඩර්ස් :- ''මිනිස් වර්ගයාගෙන් වැඩිම සංඛ්‍යාවකින් පූජා ලද තැනැත්තා ලෙස ඉතා පහසුවෙන්ම වෙන්කොට දැක්විය හැක්කේ බුදුරජාණන් වහන්සේය.''

- ✪ සමකාලීන හා නූතන අදහස් 02 බැගින් විය යුතුයි.
- ✪ එක් අදහසකට ලකුණු 01 යි .

IV.

- ✪ ප්‍රජාපති රහත් මෙහෙණින් වහන්සේගේ ආදර්ශ හතරක් පමණක් ඉදිරිපත් කර ඇතිනම් ලකුණු 02 යි.
- ✪ එම ආදර්ශ අපේ ජීවිතයේ සාර්ථකත්වයට හේතු වන ආකාරය පෙන්වා දෙමින් කර ඇති විස්තරයට, ලකුණු 03 යි.

V.

- ★ මෙම නිර්ණායක චේතනාව පදනම් කරගෙන ඇත.
- ★ ධම්ම පදයේ ''ඉධ තප්පති පෙච්ච තප්පති...."
- ★ අම්බලට්ඨික රාහුලෝවාද සූත්‍රයේ දී තමන්ට හා අනුන්ට විපාක දෙන ක්‍රියා නරක ක්‍රියා ලෙසත් යහපත ගෙන දෙන ක්‍රියා හොඳ ක්‍රියා ලෙසත් දක්වා තිබීම.
- ★ අධිපති ධර්ම තුළින් දක්වා තිබීම.
- ★ අත්තූපනායික ධර්ම තුළින් දක්වා ඇති බව.
- ★ කාලාම සූත්‍රයේ දී තමා විසින් ම ස්වාධීන තීරණ ගත හැකි බව.
- ✪ නිර්ණායක 02 ක් ඇසුරින් නම් ලකුණු 03 ක් ද,
- ✪ නිර්ණායක 04ක් ඇසුරින් නම් ලකුණු 06 ක් ද

3.

I.

නිධීනංව පවත්තාරං - යං පස්සේ වජ්ජ දස්සිනං
නිග්ගය්හවාදිං මේධාවිං - තාදිසං පණ්ඩිතං භජේ
තිදිසං භජමානස්ස - සෙය්‍යෝ හෝති නපාපියෝ"

- ✪ මෙම පිළිතුරට ලකුණු 02ක් හෝ " 0 "විය යුතුයි.
- ✪ අක්ෂර වැරදීම් 03 ට වඩා නොතිබිය යුතුයි.
- ✪ අක්ෂර වැරදීම් 04 ක් ඇත්නම් පිළිතුර වැරදි ලෙස සැලකිය යුතුයි.

II.

- ★ යමෙක් නිධානයක් දක්වන්නෙකු මෙන් කෙනෙකුගේ ඇති වරද දකියිද, එයට තරවටු කොට අවවාද කරයිද, එබඳු වූ බුද්ධිමත් නුවණැත්තෙකු සේවනය කළ යුතුයි. එබඳු කෙනෙකු ඇසුරු කරන්නාට වැඩක් මිස අවැඩක් සිදු නොවේ.
- ✪ අදහසේ අඩුවක් ඇත්නම් ලකුණු අඩු කරන්න.

III.

- ★ සැමියාගෙන් බිරිඳට.
  1. ගරු කිරීම.
  2. අවමන් නොකිරීම.
  3. පරදාර සේවනයේ නොයෙදීම.
  4. ගෙදර වගකීම් පැවරීම.
  5. ඇඳුම් පැළඳුම් සපයා දීම.

- ★ බිරිඳගෙන් සැමියාට
  1. ගෙදර කටයුතු මැනවින් සංවිධානය කිරීම.
  2. ඇසුරු කරන පිරිසට මැනවින් සංග්‍රහ කිරීම.
  3. පරපුරුෂයන් සේවනය නොකිරීම.
  4. උපයන ලද ධනය ආරක්ෂා කිරීම.
  5. සෑම කටයුත්තකම දක්ෂ වීම හා අනලස් වීම.

- ★ කරුණු දහය වෙන් වෙන් වශයෙන් හා පිළිවෙළක් අවශ්‍ය නැත.
- ✪ කරුණු දහය දැක්වීමට ලකුණු 04 යි.
- ✪ කරුණු අටක් හෝ නමයක් ඇත්නම් ලකුණු 03 යි.
- ✪ කරුණු හයක් හෝ හතක් ඇත්නම් ලකුණු 02 යි.
- ✪ කරුණු හතරක් හෝ පහක් ඇත්නම් ලකුණු 01 යි.

IV.

★ මංගල සූත්‍රයේ මංගල කරුණු 38 ක් දක්වා ඇත.

1. බාලයන් ඇසුරු නොකිරීම.
2. පණ්ඩිතයන් ඇසුරු කිරීම.
3. ශිල්පයේ දක්ෂ වීම.
4. තිදොර මනාව හික්මවීම.
5. ධර්මයේ හැසිරීම.
6. අටලෝ දහමින් කම්පා නොවීම.

- ✪ මංගල කරුණු හතරක් දක්වා ඇත්නම් ලකුණු 01 යි.
- ✪ මංගල කරුණු පහක් දක්වා ඇත්නම් ලකුණු 02 යි.
- ✪ මංගල කරුණු පහක් දක්වමින් මෙළොව දියුණුව සැලසෙන ආකාරය පැහැදිලි කරයිනම් ලකුණු 05 යි.
- ✪ සමස්ථය බලා ලකුණු දෙන්න.

V.

★ සිගාලෝවාද සූත්‍රයේ සඳහන් භෝග විනාශ මුඛ හය වන්නේ.

1. සුරා පානය,
2. අවේලාවේ වීථි සංචාරය,
3. නිතර නිතර නාට්‍ය සංදර්ශන සඳහා යාම.
4. දූ කෙලියේ යෙදීම.
5. පාප මිත්‍ර සේවනයේ යෙදීම.
6. අලස බව.

- ✪ කරුණු පහක් දැක්වීමට ලකුණු 01 යි.
- ✪ කරුණු හය දැක්වීමට ලකුණු 02යි.
- ✪ කරුණු හය දක්වා ආර්ථික පරිහානිය දැක්වීමට ලකුණු 04යි.
- ✪ කරුණු හය දක්වා සමාජ පරිහානිය දැක්වීමට ලකුණු 04 යි.
- ✪ කරුණු 6 දක්වා ආර්ථික සමාජ පරිහානිය දැක්වීමට ලකුණු 6 යි.
- ✪ සමස්ථය බලා ලකුණු දෙන්න

## II කොටස

4.

I.

- ★ දසරාජ ධර්ම.
- ★ සතර සංග්‍රහ වස්තු.
- ★ පංච සීල ප්‍රතිපදාව.
- ★ දස සක්විති වත්.
- ★ සතර අගතියෙන් වැලකීම.
- ★ කූටදන්ත සූත්‍රගත දේශපාලන මූලධර්ම.

- ✪ දේශපාලන මූලධර්ම පිළිබඳව පමණක් විස්තර කර ඇත්නම් ලකුණු 04 යි.
- ✪ මූලධර්ම පහක්වත් ඇසුරින් ආර්ථික හා සමාජ සමෘධිය ඇතිවන ආකාරය විස්තර කිරීමට ලකුණු 10 යි.
- ✪ සමස්ථය බලා ලකුණු දෙන්න.

II.

- ✪ බමුණු සමාජයේ ජීවත් වූ කාන්තාව පිළිබඳව කරන ලද විස්තරයට ලකුණු 01 යි.
- ✪ බුදු සමයෙන් කාන්තාව ලද වරප්‍රසාද නම් කර ඇත්නම් ලකුණු 02 යි.
- ✪ බුදු සමය තුලින් ලද වරප්‍රසාදයන් නිසා කාන්තාව පූජණීයත්වයට පත්වූ ආකාරය බෞද්ධ මූලාශ්‍ර ඇසුරින් දැක්විය යුතුයි.
- ✪ සමස්ථය බලා ලකුණු දෙන්න.

5.

I.

- ★ සතර සංග්‍රහ වස්තු.
- ★ පංච ශීලය.
- ★ සතර බ්‍රහ්ම විහරණ.
- ★ අල්පේච්ඡතාව.
- ★ සුභරතාවය.
- ★ සහජීවනය.

- ✪ ආචාර ධර්ම ඇසුරු කරගෙන සරල ජීවිතයක වටිනාකම දැක්විය යුතුය.
- ✪ කරුණු පහක්වත් ඇසුරින් පිළිතුර සකස් විය යුතුය. (එක් කරුණකට ලකුණු 2 බැගින්)

II.

- ★ බුදුරජාණන් වහන්සේ මෙන්ම ශ්‍රාවකයන් ද පරිසරය වර්ණා කර ඇති බව.
- ★ පරිසරය ආරක්ෂා කළ යුතු බව.
- ★ සෑම සත්වයකුගේම පැවැත්ම සඳහා පරිසරය හේතුවන බව.
- ★ වනරෝප සූත්‍රයේ එන අදහස්.
- ★ සේඛියාවල දක්වා ඇති අදහස්.

- ✪ කරුණු පහක්වත් ඇසුරු කරගෙන පිළිතුර සකස් විය යුතුයි. (එක් කරුණක් සඳහා ලකුණු 02 බැගින්)

6.

I.

- ✪ තුන්වන ධර්ම සංගායනාවේ පසුබිම දැක්වීම සඳහා ලකුණු 04 යි.
- ✪ චිර පැවැත්ම සඳහා ගනු ලැබූ ක්‍රියා මාර්ග සඳහා ලකුණු 06 යි.
- ✪ සමස්තය බලා ලකුණු දෙන්න.

II.

- ★ ද්වාර පණ්ඩිතවරුන් විසින් පවත්වන පරීක්ෂණයකින් සිසුන් තෝරා ගැනීම.
- ★ ක්‍රි.ව.983-995 කාලවලදී ද්වාර පණ්ඩිතවරු 6 දෙනෙකු විසින් විද්‍යාමණ්ඩප භාරව කටයුතු කර ඇත.
- ★ මෙම විශ්වවිද්‍යාලයේ අධ්‍යාපන කටයුතු භාරව ආචාර්යවරු 108 දෙනෙකු සිටි බව.
- ★ පරිපාලන කටයුතු සඳහා ආචාර්යවරු 114 දෙනකු සිටි බව.
- ★ මෙහි විෂය මාලාව නාලන්දා විශ්වවිද්‍යාලයේ විෂය මාලාවට සමානව පැවති බව.
- ★ අභිධර්මය, ව්‍යාකරණ, තන්ත්‍රයානය යන විෂයන් සඳහා වෙන වෙනම ගොඩනැගිලි පැවති බව.
- ★ උපාධි, පශ්චාත් උපාධි පිරිනමා ඇති බව.

- ✪ අධ්‍යාපන සැලැස්ම විස්තර කිරීමට ලකුණු 05 ක් ද
- ✪ පරිපාලන සැලැස්ම විස්තර කිරීමට ලකුණු 05ක් ද බැගින්
- ✪
- ✪ සමස්තය බලා ලකුණු දෙන්න.

7.

I.

- ★ ක්‍රි.පූ. 89 දී දෙවන වරට රාජ්‍යත්වයට පත් වලගම්බා රජු විසින් කරවූ බව.
- ★ බුදු සසුනේ ගැටළු රාශියකට අභයගිරිය මුල් වූ බව.
- ★ විදේශීය උගතුන් පිළිගැනීම, මූලායතන මගින් රට පුරා අධ්‍යාපනය ව්‍යාප්ත කිරීම, නව දාර්ශනික සංකල්ප පිළිගැනීම අභයගිරිය තුළින් සිදු වූ බව.
- ★ අභයගිරිය කීර්තිමත් අන්තර්ජාතික බෞද්ධ මධ්‍යස්ථානයක් වශයෙන් පැවති බව, පාහියන් වාර්තාවලින් හෙළිවන බව.
- ★ විවිධ පූජා විධි, පෙරහැර, පිරිත් පිංකම්, අභයගිරිය මූලිකව ඇති වූ බව.

- ✪ අභයගිරි විහාරයේ ආරම්භය දැක්වීමට ලකුණු 02 යි.
- ✪ එහි ආගමික සේවාව දැක්වීමට ලකුණු 04 යි.
- ✪ ශාස්ත්‍රීය සේවාව දැක්වීමට ලකුණු 04 යි.
- ✪
- ✪ සමස්ථය බලා ලකුණු දෙන්න

II.

- ★ බුදු දහම ජපානයට හඳුන්වා දීමට පෙර එරට පැවති ආගම "ෂින්තෝ " ආගම බව.
- ★ කොම්පියුසියස් දහම ද බුදු දහම ජපානයට ලැබීමට පෙර පැවති බව.
- ★ ක්‍රි.ව.552 දී කොරියාවේ කුදාරා රාජ්‍ය පාලකයා විසින් බුදු දහම මුල් වරට හඳුන්වා දී ඇති බව.
- ★ ජපානයේ ඇතිවූ වසංගත තත්වයන් අවසානයේ බුදු දහම කෙරෙහි එරට වැසියා නැඹුරු වූ බව.
- ★ ජපානයට බුදු දහම ලැබීමත් සමග එරට ජනතාව අතර ආචාරශීලී බව, අනතිමානීත්වය, පරෝපකාරය, ධෛර්ය සම්පන්නබව ආදී ගුණධර්ම ගොඩනැගුණ බව.
- ★ පිරිමින්ට හා සමානව කාන්තාවන්ට ද අයිතිවාසිකම් ලබා දීම.
- ★ මෘත දේහ භූමදානයෙන් වැළකී ආදාහනය කිරීමට යොමුවීම.
- ★ ජපන් ආරාම අධ්‍යාපන ආයතන, වැඩිහිටි ආයතන, සෞඛ්‍ය මධ්‍යස්ථාන බවට පත්වීම.

- ✪ ජපානයට බුදු දහම හඳුන්වා දුන් ආකාරයට ලකුණු 04 යි.
- ✪ එරට සංස්කෘතියේ පෝෂණයට හේතු වූ ආකාරය දැක්වීමට ලකුණු 06 යි.

- ✪ සමස්ථය බලා ලකුණු දෙන්න.

8.

I.

- ★ බෝසතාණන් වහන්සේගේ චරිතය නිරූපනය කරන විවිධ ජාතක කතා චිත්‍රයට නගා ඇති ආකාරය හා බුද්ධ චරිතයේ ඇති විශේෂ සිදුවීම් චිත්‍රයට නගා ඇති ආකාරය දැක්විය යුතුය.
- ★ එයින් ජනජීවිතය නව මඟකට යොමු වූ ආකාරය, පරිත්‍යාගය, කරුණාව, ආදරය, ඉවසීම, පරෝපකාරය ආදීය දක්වමින් පිළිතුර ඉදිරිපත් විය යුතුය.

- ✪ බෞද්ධ චිත්‍ර කලාව හැඳින්වීමට ලකුණු 04 යි.
- ✪ චිත්‍ර කලාව මඟින් ජන ජීවිතය වෙනස් වූ ආකාරය පෙන්වා දීමට ලකුණු 06 යි.

- ✪ සමස්ථය දෙස බලා ලකුණු දෙන්න.

II.

- ★ සද්ධර්ම රත්නාවලිය සහ ලෝවැඩ සඟරාව යන කෘතීන් මුල් කර ගනිමින් සාරධර්ම ඉදිරිපත් කළ යුතුය.
- ★ උපුටා ගැනීම් අවශ්‍යයි.

- ✪ එක් කෘතියක් ඇසුරු කරගෙන කරන ලද විස්තරයට ලකුණු 05 බැගින් කෘති දෙක සඳහා ලකුණු 10 යි.
- ✪ සමස්ථය දෙස බලා ලකුණු දෙන්න.

★ ★ ★